**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2021**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික අක්ෂි බැංකුවේ ආදායම්, වියදම්, ජංගම වත්කම් හා ජංගම බැරකම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු නමුත්, ජාතික අක්ෂි බැංකුවේ ස්ථාවර වත්කම් එම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණු අතර ඒ පිළිබඳ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2022 වසර සඳහා පිළියෙල කරන අරමුදලේ ගිණුම්වල මෙම වරද නිවැරදි කරන බව. | ජාතික අක්ෂි බැංකුව සතු වත්කම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත් අදාළ දත්ත හා තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික අක්ෂි බැංකුව විසින් විදේශීය රටවලට සපයන අක්ෂි පටල වෙනුවෙන් ඉකුත් වර්ෂ කිහිපයකදී හා සමාලෝචිත වර්ෂයේදී අයකර තිබුණු පිළිවෙලින් රු.1,980,951 ක් හා රු.4,684,458 ක්වූ පූර්ව අත්තිකාරම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු බැවින් එම අත්තිකාරම් ජංගම වගකීම් ලෙස හඳුනාගත යුතු වුවද, ඒ වෙනුවට ඒ ඒ වර්ෂයන්හි ආදායමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.4,684,458 කින් හා එදිනට සමුච්චිත අතිරික්තය රු.1,980,951 කින් වැඩියෙන්ද, එදිනට ජංගම වගකීම් රු.6,665,409 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | -එම- | නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂවලදී ජාතික අක්ෂි බැංකුව විසින් විදේශීය රටවලට සපයා තිබුණු අක්ෂි පටල වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු රු.897,082 ක් ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් එදිනට සමුච්චිත අතිරික්තය හා ජංගම වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ජාතික අක්ෂි බැංකුව විසින් ලබාගෙන තිබුණු අක්ෂි පටල ගබඩා මාධ්‍ය (Cornea Storage Media) වෙනුවෙන් අක්ෂි රෝහලට ගෙවිය යුතු රු.2,928,551 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ. | -එම- | -එම- |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.663,000 ක් ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ. | 2022 වසර සඳහා පිළියෙල කරන අරමුදලේ ගිණුම්වල මෙම වරද නිවැරදි කරන බව. | නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 වන වගන්තිය | පුද්ගලික පදනමින් රෝගීන් වෙත ආධාර ලබාදීමට අරමුදල් පනතේ ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී එක් රෝගියෙකු සඳහා රු.2,700,000 ක මූල්‍යාධාරයක් ලබාදී තිබුණි. තවද පනතේ කාර්යයන්හි විෂයපථයට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් වෙනුවෙන් සංගමයක් වෙත රු.1,000,000 ක ප්‍රදානයක් ලබාදී තිබුණි. | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව රු.2,700,000 ක මුදල මානුෂීය හේතූන් පදනම් කරගෙන හා මෙම ගෙවීම පූර්වාදර්ශයක් නොවන පරිදි අනුමත කර ඇති බව, එම වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවාවල නිරතව සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා අරමුදලේ මුදල් යෙදවිය හැකි බව, ඒ අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය වෙත රු.1,000,000 ක ප්‍රදානය 2021 සැප්තැම්බර් 21 දිනැති අධ්‍යක්ෂ | අරමුදල් පනතෙහි දක්වා ඇති කාර්යයන්හි විෂයපථයට ඇතුළත් වන ක්‍රියාකාරකම් සඳහා පමණක් මූල්‍යාධාර ලබා දිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මණ්ඩල අනුමැතියට යටත්ව ගෙවා ඇති බව හා මෙම ගෙවීම් පනතේ නීති රීති හා විධිවිධානවලට අනුකූලව සිදුකර ඇති බව. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් වන විට ඒවා ආදායමට බැර කිරීමෙන් පසුව ආපසු ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හැකිතාක් දුරට වලක්වා ගැනීමේ අදහසින් එම තැන්පතු ආදායමට බැර කිරීමට පෙර විමසීම් කර බැලිය යුතු වුවද, අරමුදල විසින් එසේ විමසීම් කිරීමකින් තොරව රු.1,429,775 ක් රජයේ ආදායමට බැර කර තිබුණි. | මුදල් රෙගුලාසි 570 අනුව ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වසර 02 ක් ගිය පසු ඉකුත් තැන්පතු ලෙස හඳුනාගත යුතු බව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2021 දෙසැම්බර් 30 දින ලබාගෙන මෙම අරමුදල් අවස්ථාවෝචිතව ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.188,434,938 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.80,133,424 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.108,301,514 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග හා වෙනත් ආදායම් රු.126,447,755 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 2013 අගෝස්තු 29දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මඟින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමට හා එහි ගනුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2022 අප්‍රේල් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු පනත මේ වන විට කැබිනට් මණ්ඩලයට යොමු කිරීමට සූදානම් කර ඇති බව, අමාත්‍යාංශයේ නීති අංශය මේ සම්බන්ධව කටයුතු කරමින් සිටින බව හා පනත සම්මතවී ජාතික අක්ෂි බැංකුව නෛතික ආයතනයක් ලෙස ස්ථාපිත වූ පසුව වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව වෙනම ආයතනික ව්‍යුහයක් සහිත නෛතික ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීම කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කරන තෙක් එහි කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමටද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා වැටුප් ගෙවීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත්, අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණවී නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ නොහැකිව තිබුණි. | අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/13/1172/509/052 දරන 2013 සැප්තැම්බර් 06 දිනැති කැබිනට් මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථා පනවන තෙක් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී ඇති බව. | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව, ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බවත්, ඒ අනුව කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බවත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතු අතර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 05 සිට වර්ෂ 09 ක් දක්වා කාල පරාසයක සිට ලැබිය යුතු රු.1,382,346 ක ණයගැති ශේෂයක් මෙම වාර්තාවේ දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මුදල් ලබා දෙන ලෙස දන්වමින් අදාළ පාර්ශව වෙත ලිපි යවා ඇති බව. | දීර්ඝ කාලයක සිට අයකර ගත නොහැකිවී තිබුණු මෙම මුදල අයකර ගැනීමට හෝ අයකර නොගැනීමට වගකිව යුතු පාර්ශවයන් වෙතොත් ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ විධිමත් පරිදි පොත්වලින් කපාහැරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කාර්යයන් අවසන්ව තිබුණු ව්‍යාපෘති 07 කට අදාළව රු.1,392,063 ක් පරිත්‍යාග කළ ආයතන වෙත ආපසු යැවීමට හෝ පොදු අරමුදල වෙත පවරාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පරිත්‍යාග මුදල් පොදු අරමුදලට බැර කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ව්‍යාපෘතිවලට අදාළ අවබෝධතා ගිවිසුම් හෝ එකඟතා ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නොඑසේ නම් ඉතිරි මුදල් අරමුදලේ පොදු අරමුදල වෙත පවරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව ආයුර්වේද නිෂ්පාදන 10 ක් විවෘත වෙළඳපොළට හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 15ක ප්‍රදානයක් 2015 මැයි 26 දින ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලබාදී තිබුණු අතර එම මුදල නව නිෂ්පාදන ඒකකයක ලාභයෙන් සියයට 10 බැගින් මාසිකව අරමුදලට බැර කිරීමට සංස්ථාව ප්‍රතිපත්තිමය වශයෙන් එකඟවී තිබුණි. නමුත් 2015 ජුනි මාසයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අරමුදල වෙත රු.1,260,427 ක මුදලක් පමණක් ලැබී තිබුණු අතර 2020 හා 2021 වර්ෂවලදී කිසිදු මුදලක් අයකර ගත නොහැකිවී තිබුණි. | 2015 සිට 2019 දක්වා කාලය තුළ ආයුර්වේද සංස්ථාව විසින් අලෙවි ආදායමෙන් රු.1,260,427 ක මුදලක් අරමුදලට බැර කර ඇති බව හා 2020 හා 2021 වර්ෂවලට අදාළව මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් යවා ඇති බව. | ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ ඇති එකඟතාව පරිදි අරමුදලට ලැබිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | රජයේ රෝහල් සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීමට හා රෝහල් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමේ අරමුණින්, සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය 1998 සැප්තැම්බර් මාසයේදී හඳුන්වාදී තිබුණු අතර සෑම දිනුම් අදින වාරයකටම ප්‍රථමයෙන් එම වාරයේ අරමුදලින් කෙරෙන කාර්යය හඳුනාගෙන ප්‍රකාශයට පත් කර එකී කාර්යය ඉටු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම 2020 හා 2021 වර්ෂ සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නිකුත් කිරීම සඳහා අරමුදලේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් වැඩ සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස 2020 මාර්තු 06 දින භාණ්ඩාගාර මෙහෙයුම් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලීමක් කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් එවැනි වැඩ සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. ලොතරැයි ආදායමෙන් කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් අරමුදල සතුව නොපැවතීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින | ඉදිරි වර්ෂවලදී මේ සම්බන්ධව කටයුතු කිරීමට අවධානය යොමු කර ඇති බව හා 2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර ඇති බව. | සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා නිසි වැඩ සැලැස්මක් පිළියෙල කිරීමටත් ඒ අනුව එම අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වනවිට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.113,551,952 ක් නිදහස් කරවා ගැනීමට නොහැකිවී තිබුණි. | | |
| (ඉ) | 2014 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.428,491,540 ක් ලොතරැයි ආදායම් ලෙස ලැබී තිබුණු අතර ඉන් රෝහල් උපකරණ මිලදීගැනීම හා රෝහල් අළුත්වැඩියාකිරීම ආදී අරමුණුගත කාර්යයන් සඳහා පිළිවෙලින් රු.20,578,392ක් හා රු.156,749,175ක් ලෙස එකතුව රු.177,327,567ක් පමණක් වැයකර තිබුණි. ලොතරැයි ආදායම් උපයෝජනය සියයට 41 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | -එම- | සෞඛ්‍ය සංවර්ධන ලොතරැයිය මගින් ලැබෙන ආදායම් අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනය කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------------- | ----------- |
| (අ) | අරමුදල වෙත 1997 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිශ්චිත කාර්යයන් 10 ක් සඳහා ලැබී තිබුණු රු.5,770,668 ක පරිත්‍යාග වර්ෂ 03 සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක් තුළ එම අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | මෙම පරිත්‍යාගයන් උපයෝජනය කර අරමුණුගත කාර්යයන් ඉටුකර ගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කර ඇති බව හා අදාළ ආයතන ඉල්ලීම් කරන තෙක් මෙම අරමුදල් වෙනත් කාර්යයන් සඳහා උපයෝජනය කළ නොහැකි බව. | අරමුදල වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති අරමුදල් අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකිවන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් හා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කර ගන්නා ආකාරය පිළිබඳ වැඩ සැලසුම් පිළියෙළ කර නොතිබුණි. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 දින වනවිට පොදු අරමුදලේ මුළු ආදායම රු.599,747,320 ක්වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදලින් වැයකර තිබුණු මුදල රු.33,458,630 ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 6 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | ඉදිරි වර්ෂවලදී මේ සම්බන්ධව කටයුතු කිරීමට අවධානය යොමු කර ඇති බව හා 2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර ඇති බව. | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකිවන පරිදි සැලසුම් හා වැඩ සටහන් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |